# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන)

**1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

---

වෙළෙඳ අමාත්‍යතුමා විසින් 2021 නොවැම්බර් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2021 ඔක්තෝබර් මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[85 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

***නීතිය බලපෑමේ ප්‍රකාශය***

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනතේ දීර්ඝ නාමය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත" යන වචන වෙනුවට "ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත" යන වචන ආදේශ කිරීම වේ.

***3 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, "ප්‍රධාන ප්‍රඥප්තිය" සහ වෙනත් ලිඛිත නීති සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනවල නීතිය බලපෑම වනුයේ-

(අ) "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත" යන වචන වෙනුවට "ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත" යන වචන; සහ

(ආ) "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යන වචන වෙනුවට "ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යන වචන,

ආදේශ කිරීම වේ.

***4 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ අරමුදලෙහි භාරකාර මණ්ඩලයෙහි සංයුතිය වෙනස් කිරීම සහ එකී මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරවරයකු පත් කිරීම වේ.

***5 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ එම වගන්තිය අදාළ වීම අරමුදලේ භාරකරුවන්ට ව්‍යාප්ත කිරීම වේ.

***6 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියට 15අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ අරමුදලේ දේපළ කෙරෙහි 1982 අංක 12 දරන පොදු දේපළ විෂයයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනතේ විධිවිධාන අදාළ කරවීම වේ.

## මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන)

එල්.ඩී.—ඕ. 5/2020

**1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

1. මේ පනත 2021 අංක   දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*1981 අංක 66 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම*

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනතේ දීර්ඝ නාමය, එහි "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යන වචන වෙනුවට "ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියට සහ වෙනත් ලිඛිත නීතියකට කරනු ලබන පොදු සංශෝධනය*

3. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක-

(අ) "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත" යන වචන; සහ

(ආ) "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යන වචන,

ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක, එකඟතාවයක, ආකෘති පත්‍රයක හෝ වෙනත් යම් ලේඛනයක "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත" සහ "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යනුවෙන් සඳහන් කර ඇති සෑම අවස්ථාවක දී ම "ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත" සහ "ලලිත් ඇතුලත් මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" ලෙස කියවා තේරුම් ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(2) (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලෙහි භාරකාර මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය:-

(අ) ප්‍රාරම්භක;

(ආ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ජනාධිපතිවරයා විසින් අවුරුදු තුනක කාලසීමාවක් සඳහා පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරවරයකු;

(ඇ) (i) උසස් අධ්‍යාපනය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ii) අධ්‍යාපනය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා; සහ

(iii) වෙළෙඳ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා,

ලෙස තත් කාලයෙහි ධුර දරන තැනැත්තන්; සහ

(ඇ) (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාරම්භක විසින් අවුරුදු පහක කාලසීමාවක් සඳහා පත් කරනු ලබන තැනැත්තන් දෙදෙනෙක්"; සහ

(2) එහි 3 වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය, එහි "අරමුදලේ සියලු නිලධරයන් හා සේවකයන්" යන වචන වෙනුවට "අරමුදලේ සියලු නිලධරයන්, සේවකයන් සහ භාරකරුවන්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 15අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 15අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු යː-

"1982 අංක 12 දරන පොදු දේපළ විෂයයෙහි ලා සිදුකරනු ලබන වැරදි පිළිබඳ පනතේ විධිවිධාන අදාළ විය යුතු බව

15අ. අරමුදලේ සියලුම චංචල සහ නිශ්චල දේපළ, 1982 අංක 12 දරන පොදු දේපළ විෂයයෙහි ලා සිදුකරනු ලබන වැරදි පිළිබඳ පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා පොදු දේපළ වශයෙන් සලකනු ලැබිය යුතු ය.".

සැක දුරුකිරීම

**7.** සැකදුරු කිරීම සඳහා "ලලිත් ඇතුලත් මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" සියලු කාර්ය සඳහා

“මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ” අනුප්‍රාප්තිකයා ලෙස සලකනු ලැබිය යුතු බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.